# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

①

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය
## ව්‍යාපාර පසුබිම

1. භාණ්ඩ හුවමාරු ක්‍රමය යනු කුමක්ද?
2. ව්‍යාපාරයක් යනු කුමක්ද?
3. ලාභ අපේක්ෂිත ව්‍යාපාරයක ප්‍රධාන අරමුණු 02ක් හා උප අරමුණු 03ක් ලියා දක්වන්න.
4. අවශ්‍යතා හා වුවමනා යන සංකල්ප නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
5. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 04ක් ලියන්න.
6. නිෂ්පාදිතයක් යනු කුමක්ද?
7. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතවල ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කර දක්වන්න.
8. නිෂ්පාදන සාධක යනු මොනවාද?
9. නිෂ්පාදන සාධක 4 නම් කරන්න.
10. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව යනු කවුරුන්ද?
11. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව 04ක් නම් කරන්න.
12. පහත දක්වා ඇති ඇල්මැති පාර්ශවයන්ගේ අරමුණු 02ක් බැගින් දක්වන්න.

| ඇල්මැති පාර්ශවය | අරමුණු |
|---|---|
| අයිතිකරුවෝ | i.<br>ii. |
| කළමනාකරුවෝ | i.<br>ii. |
| සේවකයෝ | i.<br>ii. |
| ගනුදෙනුකරුවෝ | i.<br>ii. |

13. පහත දැක්වෙන අරමුණුවලට අදාළ ඇල්මැති පාර්ශ්වයන් නම් කරන්න.

| **අරමුණ** | **ඇල්මැති පාර්ශ්වය** |
|---|---|
| අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම | |
| දෙන ලද ණය අයකර ගැනීම | |
| ලැබිය යුතු බදු ආදායම් නිසිලෙස ලබාගැනීම | |
| තම නිෂ්පාදනවල මිල තීරණය කිරීම | |

14. ඇල්මැති පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරය යමක් බලාපොරොත්තු වන්නාසේම ව්‍යාපාරයෙන්ද ඇල්මැති පාර්ශ්වයන් යම් යම් දායකත්වයන් අපේක්ෂා කරයි. ඒ අනුව පහත දක්වා ඇති ඇල්මැති පාර්ශ්වයන්ගෙන් ව්‍යාපාරයට අපේක්ෂිත දායකත්වය ගලපන්න.

| <u>ඇල්මැති පාර්ශ්වය</u> | <u>දායකත්වය</u> |
|---|---|
| A අයිතිකරුවන් | P ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබාදීම. |
| B කළමනාකරුවන් | Q ගුණාත්මක අමුද්‍රව්‍ය දිගින් දිගටම සැපයීම |
| C සේවකයන් | R නිවැරදි තීරණ ගැනීම |
| D සැපයුම්කරුවන් | S ශ්‍රම ඵලදායිතාව වැඩි කිරීම |
| E රජය | T ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය |

- ටී ෂර්ට් මැසීමේ ව්‍යාපාරයක නියුතු ජගත් කොරෝනා වසංගත තත්ත්වය ආරම්භ වීමත් සමඟ මුඛ ආවරණ මසා අලෙවි කිරීමට තීරණය කර ඇත. මේ සඳහා ඔහු විසින් නව මහන මැෂිමක් මිලදී ගත් අතර නව සේවකයෙකු ද බඳවා ගන්නා ලදී.

15. ඉහත සිද්ධියට අනුව, ජගත්ගේ ව්‍යාපාරය විසින් ඉටු කරනු ලබන අවශ්‍යතා වන්නේ,

1) ආහාර, ඇඳුම්
2) ඇඳුම්, ආරක්ෂාව
3) ඇඳුම්, නිවාස
4) ඇඳුම්, සෞඛ්‍යය

16. ඉහත සිද්ධියට අනුව ජගත්ගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
2) සේවා සැපයීමේ ව්‍යාපාරයකි
3) ලාභ අරමුණු සහිත ව්‍යාපාරයකි
4) පෞද්ගලික අංශයේ ව්‍යාපාරයකි

17. මෙම සිද්ධියේ දක්නට ලැබෙන නිෂ්පාදන සාධක වන්නේ,

1) භූමිය, ව්‍යවසායකත්වය
2) ප්‍රාග්ධනය, භූමිය
3) ප්‍රාග්ධනය, ශ්‍රමය
4) භූමිය, ශ්‍රමය

18. මෙම සිද්ධියට අදාලව නිවැරදි ඇල්මැති පාර්ශව ඇතුළත් වරණය තෝරන්න.

1) අයිතිකරු, සේවකයන්
2) සේවකයන්, තරඟකරු
3) තරඟකරුවන්, මූල්‍ය ආයතන
4) සේවකයන්, සැපයුම්කරු

19. සේවකයින්ගෙන් ව්‍යාපාරය අපේක්ෂිත දායකත්වයක් වන්නේ,

1) ප්‍රමාණවත් ප්‍රාග්ධන දායකත්වයක් ලබා දීම
2) නිවැරදි තීරණ ගැනීම හා සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම
3) පවරන ලද කාර්යය නිසි ලෙස ඉටු කිරීම
4) සාධාරණ වැටුපක් ලබා ගැනීම

20. ඇල්මැති පාර්ශවයන්ගේ අරමුණු කිහිපයක් පහත දැක්වේ.

A - ප්‍රමාණවත් ලාභයක් ලැබීම
B - සමාජ සුභසාධනයට දායක වන්නේ දැයි විමසා බැලීම
C - රැකියා අවස්ථා උත්පාදනය කිරීම
D - රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය
E - ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම

ඉහත දැක්වෙන අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිත ඇල්මැති පාර්ශ්ව අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

1) අයිතිකරු, ප්‍රජාව, රජය, කළමනාකරු, ගනුදෙනුකරු
2) අයිතිකරු, ගනුදෙනුකරු, ප්‍රජාව, කළමනාකරු, සැපයුම්කරු
3) අයිතිකරු, අනාගත ආයෝජකයෝ, කළමනාකරු, රජය, ප්‍රජාව
4) අයිතිකරු, රජය, කළමනාකරු, සේවකයෝ, ප්‍රජාව

21. ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධකයට අයත් නොවන්නේ මින් කවරක්ද?

1) යන්ත්‍ර සූත්‍ර
2) ගොඩනැගිලි
3) ඛණිජ නිධි
4) මුදල්

22. ව්‍යවසායකයා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) ව්‍යාපාර ආරම්භ කර පවත්වාගෙන යන්නා
2) ව්‍යාපාර අවදානම් දරමින් නව්‍යතා සම්පාදනය කරන්නා
3) ව්‍යාපාරයට නායකත්වය සපයන පුද්ගලයා
4) ව්‍යාපාරයට අරමුදල සපයන්නා

23. සේවා සැපයීමේ ව්‍යාපාර පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර වනුයේ,

    1) මහජන බැංකුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඉසුරු වී මෝල
    2) ඖෂධ අලෙවිසැල්, අභිමන් සහල් මෝල, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
    3) රූපලාවන්‍ය ආයතන, ඇඟළුම් කර්මාන්ත ශාලා, තොග වෙළෙඳ ආයතන
    4) සිල්ලර වෙළෙඳ ආයතන, රෝහල, තේ අලෙවිසැල

24. ආයෝජනයේ සුරක්ෂිතතාව අරමුණු කරගත් ඇල්මැති පාර්ශවය වන්නේ,

    1) අනාගත ආයෝජකයින්
    2) අයිතිකරුවන්
    3) කළමනාකරුවන්
    4) රජය

පහත ප්‍රකාශ සත්‍ය නම් (✓)ලකුණ ද අසත්‍ය නම්(×) ලකුණ ද යොදන්න.

25. අතීතයේ දී අතිරික්ත වශයෙන් නිෂ්පාදනය කිරීම තුළින් භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇති විය. (...)
26. භාණ්ඩ නිෂ්පාදනය කිරීම ව්‍යාපාරයක් ලෙස හැඳින්වේ. (...)
27. වර්තමානයේ ඇතැම් ව්‍යාපාර ගනුදෙනු සිදු කිරීම සඳහා විද්‍යුත් මාධ්‍ය භාවිතා කරයි. (...)
28. ව්‍යාපාරයක රඳා පැවැත්ම තීරණය වනුයේ ගනුදෙනුකරුවන්ගේ ආදායම් මට්ටම මතය. (...)
29. සෑම පුද්ගලයෙකුගේම අවශ්‍යතා සමාන වේ. (...)
30. ජීවත්වීම සඳහා යම් වුවමනාවක් සපුරා ගැනීම අනිවාර්ය වේ. (...)
31. ස්පර්ශ කළහැකි භෞතික පැවැත්මක් ඇති දෑ භාණ්ඩ ලෙස හඳුන්වයි. (...)
32. ව්‍යාපාර කටයුතු මෙහෙයවීම හා ව්‍යාපාර පිළිබඳ තීරණ ක්‍රියාත්මක කරනු ලබන්නේ රජය විසිනි. (...)
33. ගනුදෙනුකරුවන් විසින් නැවත විකිණීමට හෝ පරිභෝජනය සඳහා භාණ්ඩ මිලදී ගනී. (...)
34. ව්‍යාපාර හිතකර දිරිගැන්වීම් ලබා දීම රජයේ අරමුණකි. (...)

35. දිනුෂ විසින් ආනයනය කරන ලද විෂබීජ නාශක දියර බෝතල් හා මුඛ ආවරණ ප්‍රධාන මාර්ගය අසල ජංගම රථයක තබා පාරේ යන එන මගීන්ට අලෙවි කරයි.
    I. දිනුෂගේ ව්‍යාපාර කටයුත්ත මඟින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
    II. එය සපුරාලන වුවමනා දක්වන්න.

36. මුහුදුබඩ ප්‍රදේශයක ජීවත්වන අකිලා විසින් සිප්පිකටුවලින් අත් පළඳනා සෑදීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඒ සඳහා ඇය විසින් නූල්, කතුරු හා මැලියම් මිලදී ගත් අතර, අත් පළඳනා සෑදීමට ඇයගේ යෙහෙළිය වන අයෝමිගේ සහාය ලබා ගන්නා ලදී.
    I. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි නිෂ්පාදන සාධක කවරේද?
    II. ඔබ නම් කළ නිෂ්පාදන සාධක සඳහා උදාහරණ සිද්ධිය ඇසුරින් දක්වන්න.

37. ලසිත් විසින් කොළඹ ප්‍රදේශයෙන් පාවහන් මිලදී ගෙන අලෙවි කිරීමේ වෙළෙඳසැලක් රජයේ කාර්යාල කිහිපයක් පවතින බත්තරමුල්ල ප්‍රදේශයේ දී ආරම්භ කරන ලදී. ඊට ආසන්නයේම නිෂාල විසින් පාවහන් නිර්මාණය කිරීමේ හා පාවහන් අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

    I. ලසිත්ගේ හා නිෂාලගේ ව්‍යාපාර නිෂ්පාදිතවල ස්වභාවය අනුව කවර වර්ගයකට අයත් ව්‍යාපාර දැයි වෙන වෙනම ලියා දක්වන්න.
    II. ලසිත්ගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇල්මැති පාර්ශව 02ක් නම් කොට ඔවුන්ගේ අරමුණු වෙන වෙනම ලියා දක්වන්න.



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව